# සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ගාස්තු නිවේදනය

**කුඩා පරිමාණ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් (Standardised Power Purchase Agreement - SPPA) යටතේ ජාතික විදුලිබල පද්ධතිය වෙත විදුලිය මිලදී ගැනීම**

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (Non Conventional Renewable Energy – NCRE) මූලාශ්‍රයන් වෙතින් ලංකා විදුලිබල මණ්ඩලය මිලදී ගනු ලබන විදුලිබලය සඳහා නව ගාස්තු නිවේදනය කරනු ලබයි. තවදුරටත්, ගාස්තු සහ කුඩා පාරිමාණ විදුලිය මිලදී ගැනීමේ (SPPA) ගිවිසුම සම්මත සහ සාකච්ඡා කළ නොහැකි එකක් ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත. නව ගාස්තු පිරිවැය පාදක හා තාක්ෂණ සුවිශේෂී වන අතර, සංවර්ධනකරුවන්ට ස්ථර තුනේ ක්‍රමය හෝ ස්ථාවර ගාස්තු ක්‍රමය යන දෙකෙන් එකක් තෝරා ගැනීමට ඉඩ සැලසෙනු ඇත. SPPA ගිවිසුම් මෙ.වො. 10 දක්වා ධාරිතාවයක් සහිත ව්‍යාපෘති සඳහා අදාළ වනු ඇති අතර, ඒවා වසර 20ක කාලයක් සඳහා බල පැවැත්වෙන අතර දීර්ඝ කළ හැක්කේ අන්‍යොන්‍ය එකඟතාවය අනුවය.

මෙම ගාස්තු නැවත දැනුම් දෙන තුරු නොවෙනස්ව බලපවත්වනු ඇති අතර, ගාස්තු සංශෝධනය අවශ්‍යතාවය මත පමණක් සිදු කෙරෙනු ඇත.

මෙදින සිට ඉදිරියට අත්සන් කරනු ලබන කුඩා පරිමාණ විදුලිට මිලදී ගැනීමේ SPPA ගිවිසුම් මත පදනම් වූ ජාතික විදුලිබල පද්ධතිය වෙත මිලදී ගනු ලබන සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන් භාවිතා කර නිපදවන විදුලිබලය සඳහා ගෙවනු ලබන මිල ගණන්, පහතින් දැක්වේ.

සියලුම මිල ගණන් කිලෝ වොට් පැයක් සඳහා ලංකා රුපියල් වලින් වේ (රු./කිවොපැ)

## 1 වන විකල්පය : ත්‍රිත්ව ස්ථර ගාස්තු ක්‍රමය

මෙය ස්ථාවර ගාස්තුවකින්, මෙහෙයුම් හා නඩත්තු ගාස්තුවකින් සහ ඉන්ධන ගාස්තුවකින් සමන්විත වනු ඇත.

| තාක්ෂණ | වැඩි කළ හැකි මූලික මෙහෙයුම් හා නඩත්තු ගාස්තුව | වැඩි කළ හැකි මූලික ඉන්ධන ගාස්තුව | වැඩි කළ නොහැකි ස්ථාවර ගාස්තුව | | වැඩි කළ හැකි අවුරුදු 16+ මූලික ගාස්තුව | අවුරුදු 16 + විදුලිය මිලදී ගන්නන් විසින් කෙළින්ම ගෙවනු ලබන රාජ්‍ය භාගය |
|---|---|---|---|---|---|---|
| | | | අවු: 1 - 8 | අවු: 9 -15 | | |
| කුඩා පරිමාණ ජල | 1.55 | නැත | 14.18 | 5.16 | 1.62 | මුළු ගාස්තුවෙන් 10%ක් |
| සුළං | 2.46 | නැත | 22.53 | 8.19 | 1.62 | මුළු ගාස්තුවෙන් 10%ක් |
| ජෛව ස්කන්ධ | වසර 1සිට 15 දක්වා 1.24<br>වසර 16 සිට ඉදිරියට 1.55 | 7.14 | 8.50 | 3.09 | 1.62 | රාජ්‍ය භාගයක් නැත |
| කෘෂිකාර්මික හා කාර්මික අපද්‍රව්‍ය | වසර 1 සිට 15 දක්වා 1.24<br>වසර 16 සිට ඉදිරියට 1.55 | 3.56 | 8.50 | 3.09 | 1.62 | රාජ්‍ය භාගයක් නැත |
| නාගරික අපද්‍රව්‍ය | 3.13 | නැත | 12.26 | 4.46 | 1.62 | රාජ්‍ය භාගයක් නැත |
| අපතේ යන තාප ප්‍රාකෘත්‍යනය | 0.49 | නැත | 10.15 | 3.69 | 1.62 | රාජ්‍ය භාගයක් නැත |
| 2009 වර්ෂය සඳහා ඉහළ දැමීමේ අනුපාතය | 8.06% | 5.37% | නැත | නැත | 5.37% | |

සටහන 01: මෙහෙයුම් හා නඩත්තු ගාස්තුව සහ ඉන්ධන ගාස්තුව ඉහළ දැමීම වාණිජ කටයුතු ආරම්භ වූ දිනට පසුව එළඹෙන ජනවාරි මස 01 දින සිට ආරම්භ වේ.

සටහන 02: එක් එක් වර්ෂය සඳහා අදාළ ඉහළ දැමීමේ අනුපාතය එම වර්ෂය සඳහා නිවේදනය කළ අනුපාතය වේ.

සටහන 03: 1 වන ස්ථරයේ ඉහළ ගාස්තුව පියවා ගැනීම සඳහා, සංවර්ධනකරුවන්ට අඩු වශයෙන් 1 වන ස්ථරයෙන් බෙදා හරින ලද ප්‍රමාණයට සමාන විදුලිය ප්‍රමාණය 2 ස්ථරයෙන් ලබාදිය යුතුය. මෙම නියමය ස්ථර 2 විදුලිය බෙදා නොහැරීම සඳහා වන දඩුවම් ද සමඟින් ගිවිසුමෙහි දක්වනු ලබයි.

සටහන 04: ජෛව ස්කන්ධ යනු තිරසාර ලෙස වගාකළ දර වේ.

## 2 වන විකල්පය : ස්ථාවර ගාස්තු ක්‍රමය

| තාක්ෂණය | අවුරුදු 1 - 20 සඳහා සියල්ල ඇතුළත් ගාස්තුව (රු/කිවොපැ) |
|---|---|
| කුඩා පරිමාණ ජල | 14.58 |
| සුළං | 23.07 |
| ජෛව ස්කන්ධ | 18.56 |
| කෘෂිකාර්මික හා කාර්මික අපද්‍රව්‍ය | 13.88 |
| නාගරික අපද්‍රව්‍ය | 15.31 |
| අපතේ යන තාපය ලබා ගැනීම | 9.55 |

සටහන 01 : ස්ථාවර ගාස්තුව කිසිදු හේතුවක් මත මුළු අවුරුදු 20ක කාලය තුළම වැඩි නොකෙරෙනු ඇත.

සටහන 02 : 20 වන අවුරුද්දෙන් පසුව වන දීර්ඝ කිරීම් 1 වන විකල්පයේ ගාස්තු වලට සමාන වේ.

1 වන විකල්පය හෝ 2 වන විකල්පය තෝරා ගැනීම සංවර්ධනකරුගේ අභිමතය අනුව සිදුකළ හැකි අතර, එයගිවිසුම අත්සන් කරන අවස්ථාවේදීම තෝරා ගත යුතුය.

Selacine

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
3G 17 බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව
කොළඹ 00700.
විද්‍යුත්තැපෑල : info@energy.gov.lk
වෙබ් අඩවිය : www.energy.gov.lk

2009 අප්‍රේල් 24